කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය - දකුණු පළාත
முகாமைத்துவ அபிவிருத்தி பயிற்சி நிலையம் - தென் மாகாணம்
Management Development & Training Institute - Southern Province
වක්වැල්ල, ගාල්ල. வக்வெள்ள,காலி. Wakwella, Galle.
MDTI SP
Success through the Management and Development

මගේ අංකය. எனது இல. My No. MDTI/SP/TU/TP/2025/දෙමළ
ඔබේ අංකය. உமது இல. Your No.
දිනය திகதி Date 2025.10.10

ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය,
ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු / සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දෙමළ භාෂා ප්‍රවීණතාවය පාඨමාලා සඳහා පුහුණුලාභීන් කැඳවීම.</u>**

“රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම” ට අදාළ අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය නිලධාරීන් සම්පූර්ණ කර ගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම අනුව, දෙමළ භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීමට දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය විසින් කටයුතු සංවිධානය කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සේවා මට්ටම ප්‍රකාරව, පහත පරිදි දෙමළ භාෂා පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

| අනු අංකය | රා.ප.ච.03/2016 අනුව සේවා මට්ටම | පාඨමාලා කාලය | වැඩසටහන් පවත්වනු ලබන දින |
|---|---|---|---|
| 01 | ප්‍රාථමික මට්ටම | පැය 100 | සඳුදා දිනවල |
| 02 | ප්‍රාථමික මට්ටම | පැය 100 | අඟහරුවාදා දිනවල |
| 03 | ප්‍රාථමික මට්ටම | පැය 100 | බදාදා දිනවල |
| 04 | ප්‍රාථමික මට්ටම | පැය 100 | බ්‍රහස්පතින්දා දිනවල |
| 05 | ද්විතීයික මට්ටම | පැය 150 | සිකුරාදා දිනවල |
| 06 | ද්විතීයික මට්ටම | පැය 150 | සෙනසුරාදා දිනවල |

03. එබැවින්, ඔබ ආයතනයේ සේවයේ නියුතු දෙමළ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු හා මෙම පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධවීමට අපේක්ෂිත නිලධාරීන් සිටී නම්, අදාළ ආයතනවල රාජකාරී කටයුතුවලට බාධාවක් නොවන පරිදි නිලධාරීන් පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ කරවීමට කටයුතු කරන ලෙසත්, එම නිලධාරීන්ගේ තොරතුරු පහත දක්වා ඇති සබැඳි (Links) මගින් හෝ පහත දක්වා ඇති QR කේත මගින් හෝ **<u>2025 ඔක්තෝබර් මස 24 වන දිනට පෙර</u>** ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

සඳුදා කණ්ඩායම ප්‍රාථමික මට්ටම පැය 100
https://docs.google.com/forms/d/e/1FAIpQLScIy_6TzgKGN8vEqy8B5UY_Zr0cXLOVQat95wOe02HnVm6YTg/viewform?usp=header

අඟහරුවාදා කණ්ඩායම ප්‍රාථමික මට්ටම පැය 100
https://docs.google.com/forms/d/e/1FAIpQLSeJELymAFqcBnZtOk73l0I5atfs1NfukXCOhL5jU76mZKO46w/viewform?usp=dialog

බදාදා කණ්ඩායම ප්‍රාථමික මට්ටම පැය 100
https://docs.google.com/forms/d/e/1FAIpQLSdyykKLLvGc_TJszq6wOzXQb1v8o1ojGNAUYZ-EQv8xSIpBXA/viewform?usp=dialog

බ්‍රහස්පතින්දා කණ්ඩායම ප්‍රාථමික මට්ටම පැය 100
https://docs.google.com/forms/d/e/1FAIpQLSeq71ASAeupMMz1Wrh0RGNcAEP4zFUSuRcPm040Jd2sulx41g/viewform?usp=header

සිකුරාදා කණ්ඩායම ද්විතීයික මට්ටම පැය 150
https://docs.google.com/forms/d/e/1FAIpQLSfzN3qArGcTNhl9GeBLWJsP0tz6QjwH3zgpoSYCQDOOHRQcGA/viewform?usp=header

අධ්‍යක්ෂ பணிப்பாளர் Director 091 2 235386
සහකාර අධ්‍යක්ෂ உதவிப் பணிப்பாளர் Assistant Director 091 4 944023
www.mdtisp.lk
mdtisp@hotmail.com
කාර්යාලය அலுவலகம் Office 091 2 246716 091 4 944190
ෆැක්ස් தொலை நகல் Fax 091 2 246716 091 2 243280
පුහුණු අංශය பயிற்சிக் கூடம் Training Unit 091 3 907135 091 4 944021
Follow Us:
https://www.facebook.com/Management-Development-Training-Institute-Southern-Province-535188489903524/
https://twitter.com/MDTI_sp

සෙනසුරාදා කණ්ඩායම ද්විතීයික මට්ටම පැය 150
https://docs.google.com/forms/d/e/1FAIpQLSdjJigMkDDYhqwhQLcXclRbavgt4fYhETtdYU_jMEPxVH-okQ/viewform?usp=header

| පැය 100 | පැය 100 | පැය 100 | පැය 100 | පැය 150 | පැය 150 |
|---|---|---|---|---|---|
| සඳුදා කණ්ඩායම | අඟහරුවාදා කණ්ඩායම | බදාදා කණ්ඩායම | බ්‍රහස්පතින්දා කණ්ඩායම | සිකුරාදා කණ්ඩායම | සෙනසුරාදා කණ්ඩායම |

04. ඉහත පුහුණු වැඩසටහන් සඳහා සබැඳි (Links) මගින් සහභාගීත්වය තහවුරු කරන ඔබ ආයතනයේ සෑම නිලධාරියෙක්ම **රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති A ආකෘති පත්‍රය බැගින් සම්පූර්ණ කර ආයතන ප්‍රධානී නිර්දේශය සහිතව තැපැල් මගින් කඩිනමින් අප වෙත යොමු කළ යුතුය.** (A ආකෘති පත්‍රය ඇමුණුම 01 ලෙස දක්වා ඇත)


**05. තවද මෙම A ආකෘති පත්‍රයේ දකුණු පස ඉහළ කෙළවරේ ඇති කොටුව තුළ නිලධාරියා සහභාගී වන දිනය සඳහන් කිරීම අනිවාර්ය වන අතර, එසේ සඳහන් කර එවන දිනට පමණක් නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කර ගැනීමට කටයුතු කරන බවත්, එසේ දිනය සඳහන් නොකරන ලද A ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරන බව ද කාරුණිකව දන්වා සිටිමි.**

06. ගූගල් සබැඳි (Links) මගින් ලියාපදිංචි වීම පමණක් ඇතුලත් වීමට සුදුසුකම් නොලබන අතර, **A ආකෘතිය** බාර දෙන පිළිවෙළ මත පුහුණුලාභීන් ඇතුළත් වීම සිදු කරන බැවින්, හැකි ඉක්මණින් එම ආකෘති යොමු කළ යුතුය. තවද පුහුණුලාභීන් ඇතුළත් කිරීම පිළිබඳව අවසන් තීරණය දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය සතුවේ.

07. තවද පැය 100 සහ පැය 150 දෙමළ පාඨමාලාවන් සඳහා දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය වෙත මේ වන විට ලිපි මගින් ඉල්ලීම් කර ඇති සියළු නිලධාරීන් ද **ඉහත සඳහන් ආකාරයට සහභාගීත්වය තහවුරු කිරීම අනිවාර්ය බව** කාරුණිකව පෙන්වා දෙමි.

08. මෙම පුහුණු වැඩසටහන් පෙ.ව. 9.00 ට ආරම්භ වී ප.ව. 4.00 ට අවසන් වීමට නියමිත අතර, සම්පූර්ණ පාඨමාලා කාලය තුළ රැඳී සිටිය යුතු වේ. තවද මෙම පුහුණු පාඨමාලා සඳහා සහභාගි වන නිලධාරීන්හට නොමිලේ ආහාරපාන සපයනු ලැබේ.

09. ඒ අනුව, ඔබ ආයතනය හා ඒ යටතේ පවතින අදාළ නිලධාරීන් මේ පිළිබඳව **නොපමාව දැනුවත් කරන ලෙස** වැඩිදුරටත් දන්වා සිටින අතර මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.



**ඒ.පී.ජී. රොෂාන් අමරසිංහ,**
**අධ්‍යක්ෂ,**
**කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය,**
**දකුණු පළාත.**

**සැ.යු. :- ඔබ විසින් සම්පූර්ණ කරන ලද A ආකෘති පත්‍රය 2025.10.31 වන දිනට ප්‍රථම දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය වෙත තැපැල් මගින් යොමු කිරීමට කටයුතු කළ යුතු අතර, ඉන් පසු ලැබෙන A ආකෘති පත්‍රවලට අදාල පුහුණුලාභීන්ගේ නම් ගූගල් පෝරමයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.**